**72,** පාර්ක් වීදිය, කොළඹ-**2,** ශ්‍රී ලංකාව
දු.ක: +94 11 231 4041/2/3/5 ෆැක්ස්: +94 11 231 4040
විද්‍යුත් තැපැල: info@ihp.lk වෙබ: www.ihp.lk ට්විටර්: @ihplk

## මාධ්‍ය ප්‍රකාශය

**නිකුත් කිරීම**

දිනය: 2023 නොවැම්බර් 17
වේලාව: ශ්‍රී ලංකා වේලාවෙන් ප.ව 12.00

**වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධ කර ගැනීමට**

ඩැල්රින් බාත්ලට්
විද්‍යුත් තැපැල: dalreen `at' ihp.lk


**ප්‍රධාන විමර්ශකයා සම්බන්ධ කර ගැනීමට**

ආචාර්ය රවී රන්නන්-එලිය
විද්‍යුත් තැපැල: ravi `at' ihp.lk ට්විටර්: @ravirannaneliya

# අනුර දිසානායක කෙරෙහි හිතකරත්වය තවදුරටත් වර්ධනය වී ඇති අතර අනෙකුත් පක්ෂ නායකයින් කෙරෙහි එය නරක අතට හැරී ඇත

*නමුත් ඔක්තෝම්බර් මාසයේදී සියලුම පක්ෂ නායකයින් කෙරෙහි සෘණාත්මක ශ්‍රේණිගත කිරීම් පවතී*

IHP SLOTS ඔක්තෝම්බර් මස මත විමසීමේදී, සියලුම ප්‍රධාන පක්ෂ නායකයින්ට සෘණාත්මක හිතකරත්ව ශ්‍රේණිගත කිරීම් දිගටම පැවතුනි. නමුත් NPP/JVP නායක අනුර කුමාර දිසානායකගේ ශ්‍රේණිගත කිරීම -9 (ලකුණු 10කින් ඉහළට) දක්වා වර්ධනය වී ඇත. අනෙකුත් නායකයින්ගේ හිතකරත්ව ශ්‍රේණිගත කිරීම් පහත වැටී ඇත. SJB නායක, සජිත් ප්‍රේමදාසගේ හිතකරත්වය -66ක (ලකුණු 13 කින් අඩුව) නව අවම මට්ටමක් දක්වා පහත වැටී ඇති අතර, මෙය ජනාධිපති රනිල් වික්‍රමසිංහගේ ලකුණු මට්ටමට ආසන්න වන අතර ඔහු ද ලකුණු 8කින් අඩුව -65 දක්වා පහත වැටී ඇත.



එක් එක් මාසය සඳහා වන හිතකරත්ව ඇස්තමේන්තු පදනම් වන්නේ අවම ප්‍රතිචාර එකතුවක් සහතික කිරීම සඳහා එම මාසය තුළ දී සහ ඊට පෙර සහ පසු සති කිහිපයක් තුළ පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ 100-500ක් මත ය. 2023 ඔක්තෝම්බර් මස ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ 394 (සජිත් ප්‍රේමදාස), 358 (අනුර දිසානායක), 387 (රනිල් වික්‍රමසිංහ) සහ 179 (ගෝඨාභය රාජපක්ෂ) සම්මුඛ සාකච්ඡා මතය.

**සංස්කාරකවරුන්ට සටහන**

ඇතැම් විට මහජනතාව මාධ්‍යය විසින් වාර්තා කරන මෙම සංඛ්‍යා වරදවා වටහා ගන්නා බව අපිට අවබෝධ විය. සෘණ ලකුණු, එනම්, ශුන්‍යයට වඩා අඩු සමස්ත හිතකරත්ව ශ්‍රේණිගත කිරීමකින් අදහස් වන්නේ එම පුද්ගලයා හෝ ආයතනය කෙරෙහි හිතකර මතයක් නොපවතින බවයි. ධනාත්මක ලකුණු පමණක්, එනම්, ශුන්‍යයට වඩා වැඩි සමස්ත හිතකරත්වයකින් අදහස් වන්නේ එම අදාල පුද්ගලයා හෝ ආයතනය කෙරෙහි හිතකර මතයක් පවතින බවයි.

**අදාළ වාර්තා**

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 ඔක්තෝම්බර්, “සැප්තැම්බර් මාසයේදී ප්‍රධාන පක්ෂ නායකයින් අතරින් අවම සෘණාත්මක හිතකරත්ව ශ්‍රේණිගත කිරීම අනුර කුමාර දිසානායකට වේ.” *https://ihp.lk/news/pres_doc/IHPPressRelease20231020.pdf* යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 සැප්තැම්බර්, “අගෝස්තු මාසයේදී අනුර කුමාර දිසානායක කෙරෙහි මහජන හිතකරත්වය වැඩිව ඇති නමුත් සජිත් ප්‍රේමදාසට අඩුව ඇත.” https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230920.pdf යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 අගෝස්තු, “2023 ජූලි මාසයේදී ජා.ජ.බ./ජ.වි.පෙ. නායක අනුර කුමාර දිසානායකගේ හිතකරත්වය සැලකිය යුතු ලෙස අඩුවී ඇත” *https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230816.pdf* යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 ජූලි, “2023 ජූනි මාසයේ දී සියලුම ප්‍රධාන පක්ෂ නායකයින්ගේ හිතකරත්ව ශ්‍රේණිගත කිරීම් පහත වැටී ඇත” *https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230720.pdf* යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 මැයි, “2023 අප්‍රේල් මාසයේදී ධනාත්මක ශුද්ධ හිතකර ශ්‍රේණිගත කිරීමක් ඇති එකම ප්‍රධාන පක්ෂ නායකයා වන්නේ අනුර කුමාර දිසානායක වේ.” *https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230518.pdf* යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 මාර්තු, “ශ්‍රී ලාංකිකයන් සියලුම දේශපාලන පක්ෂ නායකයින් සම්බන්ධයෙන් දිගින් දිගටම අහිතකර අදහස් දරයි. බොහෝ පුද්ගලයන්ට ප්‍රංශ ජනාධිපති මැක්‍රොන්ට වඩා අඩු හිතකරත්වයක් ඇති අතර, සුළු ධනාත්මක ශ්‍රේණිගත කිරීමක් ඇත්තේ ස්වල්ප දෙනෙකුට පමණි.” *https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230328.pdf* යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 පෙබරවාරි, “2022 වර්ෂය අවසන් වන විට රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා කෙරෙහි ඔහුගේ පූර්වගාමියාට වඩා වැඩි හිතකරත්වයක් තිබූ නමුත් මහජනතාව සියලු පක්ෂ නායකයින් කෙරෙහි අහිතකර මතයක් දරනු ලබයි.” *https://www.ihp.lk/news/pres_doc/IHPPressRelease20230208.pdf* යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2022 අප්‍රේල්, “SLOTS හිතකරත්ව ශ්‍රේණිගත කිරීම්: මහජන හිතකරත්වය මැනීමේ ක්‍රමවේදය”, SLOTS වාර්තාව #2022-03. *https://ihp.lk/publications/docs/SLOTSReport202203.pdf* යෙන් ලබා ගත හැකිය.

### සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය (IHP) පිළිබඳව

IHP යනු ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි ස්වාධීන, පක්ෂග්‍රාහී නොවන පර්යේෂණ මධ්‍යස්ථානයකි. SLOTS හි ප්‍රධාන විමර්ශකයා වන්නේ IHP හි ආචාර්ය රවී රන්නන්-එලිය මහතා යි. ඔහු හාවඩ් විශ්ව විද්‍යාලයේ මහජන මත විමසුම් සමීක්ෂණ පිළිබඳ පුහුණුව ලබා ඇති අතර දශක තුනක් පුරා විවිධ මත විමසුම් සමීක්ෂණ සිදු කරමින් සිටියි.

### ක්‍රමවේදය

අහඹු ජංගම දුරකථන අංක ඇමතීමෙන් සම්බන්ධ කරගත් වැඩිහිටියන්ගේ (වයස අවුරුදු 18 සහ ඊට වැඩි) නියැදියක් සහ මීට පෙර අහඹු තෝරා ගැනීමකින් බඳවා ගන්නා ලද ප්‍රතිචාර දැක්වූවන්ගේ නියැදියක්, SLOTS මඟින් සමීක්ෂණයට ලක් කරනු ලබයි. SLOTS මඟින් හිතකරත්වය නිරීක්ෂණය කරන්නේ ප්‍රසිද්ධ චරිතයක් හෝ ආයතනයක් ගැන හිතකර හෝ අහිතකර මතයක් තිබේ දැයි ප්‍රතිචාර දැක්වූවන්ගෙන් විමසීමෙනි: ශුද්ධ හිතකරත්වය යනු ධනාත්මක (+100) සහ ඍණාත්මක (-100) ප්‍රතිචාරවල සාමාන්‍යය වේ. වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ජනවාර්ගිකත්වය, සමාජ ආර්ථික තත්ත්වය, අංශය, පළාත සහ පසුගිය ඡන්ද මනාපය භාවිතයෙන් ජාතික ජනගහනයට ගැළපෙන පරිදි සියලුම ඇස්තමේන්තු නැවත සකස් කර ඇත. මාසික ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ සෑම මාසයකම සහ ඊට පෙර සහ පසු සතිවල කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ 100+ ක නියැදියක් මත ය.

### අරමුදල් සැපයීම

නීලන් තිරුචෙල්වම් භාරය, එක්සත් රාජධානියේ සෞඛ්‍ය හා සත්කාර පර්යේෂණ සඳහා වන ජාතික ආයතනය (NIHR), ශ්‍රී ලංකාවේ ආසියා පදනම සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් SLOTS සඳහා අරමුදල් සපයයි. නමුත් අධ්‍යයන සැලසුම්, සහ සොයාගැනීම් විශ්ලේෂණය සහ අර්ථකථනය කිරීමේදී අනුග්‍රාහකයින් කිසිදු කාර්යභාරයක් ඉටු නොකරයි. වඩාත් සවිස්තරාත්මක දත්ත සහ ප්‍රතිඵල සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට IHP සම්බන්ධ කර ගත හැකිය.